**ශීර්ෂය 209  ජාතික ලේඛනාරක්ෂක දෙපාර්තමේන්තුව**

**-----------------------------------------------------------**

**1.** **මූල්‍ය ප්‍රකාශන**

**------------------**

1.1 **තත්ත්වාගණනය කළ මතය**

**-----------------------------------**

ජාතික ලේඛනාරක්ෂක දෙපාර්තමේන්තුවේ 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2022 ජූනි 02 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2022 ජූනි 02 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2021 දෙසැම්බර් 31 දිනට  ජාතික ලේඛනාරක්ෂක දෙපාර්තමේන්තුවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.2 **තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

**---------------------------------------------**

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3. **මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ  වගකීම**

**----------------------------------------------------------------------------------------------------------**

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරිම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුව  විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4. මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

---------------------------------------------------------------

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවාද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

## 1.5. වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

----------------------------------------------------

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඇ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මා විසින් කර තිබුණු නිර්දේශයන් ක්‍රියාත්මක කර තිබුණි.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

-----------------------------------------

### 1.6.1 ගිණුම්කරණ අඩුපාඩු

------------------------

**(අ) රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ සැසඳුම් ප්‍රකාශය**

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් "බී" ගිණුමට අදාළව ණය පාලන ගිණුම අනුව 2021 දෙසැම්බර් 31 දිනට අත්තිකාරම් "බී" ගිණුමෙහි වර්ෂ අවසාන ශේෂය රු.20,824,017 ක් වූ අතර, එදිනට භාණ්ඩාගාර පොත් අනුව එම ශේෂය රු.20,560,109 ක් විය. ඒ අනුව වෙනස රු.263,908 ක් විය. | මෙම වෙනස මේ වන විට නිරවුල් කරමින් පවතී. | මෙම වෙනස හඳුනාගෙන නිරවුල් කිරීමට කටයුතු කළ යුතුය. |

**(ආ) ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| **(i)** | **ඇප ලේඛනය** | | |
| | මුදල් රෙගුලාසි 891(1) ප්‍රකාරව ඇප තැබිය යුතු නිලධාරීන් හා සේවකයන්ගේ තොරතුරු ඇතුළත් ඇප ලේඛනයක් පිළියෙල කර නොතිබුණි. | රේඛීය අමාත්‍යාංශයේ උපදෙස් ලබාගනිමින් ඉදිරියේදී එම ලේඛන සකස් කිරීමට අවශ්‍ය පියවර ගනිමින් පවතී. | මුදල් රෙගුලාසි 891(1) සඳහන් තොරතුරු ඇතුළත් වන පරිදි ඇප තැබිය යුතු නිලධාරීන් පිළිබඳ ඇප ලේඛනයක් පවත්වා ගත යුතුය. |
| **(ii)** | **ණය සහ අත්තිකාරම් ලේඛනය** | | |
| | 2017 ජූලි 05 දිනැති අංක 256/2017 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛයේ 05 ඡේදය ප්‍රකාරව ණය හා අත්තිකාරම් ලේඛනය පිළියෙල කර නොතිබුණි | විගණන නිරීක්ෂණ හා එකඟ වෙමි. | 2017 ජූලි 05 දිනැති අංක 256/2017 දරන රජ්‍ය ගිණුම් චක්‍රලේඛයේ 05 ඡේදය ප්‍රකාරව සී.සී.10 ආකෘතිය හා ඒ ආකෘතිය පදනම් කරගෙන ණය හා අත්තිකාරම් ලේඛන පිළියෙල කළ යුතුය. |

**2.** **මූල්‍ය සමාලෝචනය**

-------------------------

**2.1.** **අග්‍රිම කළමනාකරණය**

-------------------------

| **විගණන නිරීක්ෂණය** | **ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|
| 2021 වර්ෂයේ භාණ්ඩාගාරයේ අග්‍රිම සාරාංශ වාර්තාව අනුව (SA – 70) අග්‍රිම ලැබීම් එකතු වටිනාකම රු.272,902,979 ක් වුවත්, මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය තුළ සහ අග්‍රිම ලැබීම් ලිපි ලේඛන අනුව අග්‍රිම ලැබීම් එකතුව රු.268,638,000 ක් විය. ඒ අනුව භාණ්ඩාගාර වාර්තා සමඟ සැසඳීමේදී අග්‍රිම ලැබීම් එකතුව රු.4,264,979 කින් වෙනස් වූ අතර, ඒ සඳහා වන පැහැදිලි කිරීම් විගණනය වෙත ඉදිරිපත් නොකරන ලදී. | මෙම වෙනස අනෙකුත් ලැබීම් වන අතර, මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය තුළ සෘජුවම භාණ්ඩාගාරයෙන් ලැබීම් පමණක් සටහන් කර ඇත. | මෙම වෙනස සොයා බලා හඳුනාගෙන නිරවුල් කළ යුතුය. |

**2.2.** **බැරකම් හා බැඳීම් වලට එළඹීම**

----------------------------------

| **විගණන නිරීක්ෂණය** | **ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|
| 2021 වර්ෂයේදී දෙපාර්තමේන්තුවේ ප්‍රධාන ගොඩනැගිල්ල ප්‍රතිසංස්කරණය කර මධ්‍ය වායු සමන, ගිනි නිවන සහ උසස් ආරක්ෂණ පද්ධතීන් ස්ථාපනය කිරීමේ ව්‍යාපෘතිය සඳහා මුදල් ප්‍රතිපාදන වෙන් වී නොතිබුණු අතර, 2022 වර්ෂයේදී ද මෙම කාර්යය සඳහා ප්‍රමාණවත් මූල්‍ය ප්‍රතිපාදන වෙන් නොවීම ප්‍රතිසංස්කරණ කටයුතු අවසන් කිරීමට බාධාවක් වී තිබුණි. 2021 දෙසැම්බර් 31 දිනට එම ව්‍යාපෘතියේ උපදේශන ගාස්තු වශයෙන් ඉංජිනේරු කාර්යයන් පිළිබඳ මධ්‍යම උපදේශක කාර්යාංශයට (CECB) ගෙවීමට රු.7,591,568 ක බිල් පතක්ද ප්‍රතිසංස්කරණ කටයුතු වෙනුවෙන් සී/ස මධ්‍යම ඉංජිනේරු සේවා (පෞද්ගලික) සමාගමට (CESL) ගෙවීමට රු.20,508,661 ක බිල් පතක්ද පැවති නමුත්, 2021 මූල්‍ය ප්‍රකාශන තුළ බැරකම් හා බැඳීම් යටතේ ඒ පිළිබඳව සටහන් කර නොතිබුණි. | 2021 වර්ෂය සඳහා ප්‍රමාණවත් මූල්‍ය ප්‍රතිපාදන නොවූ බැවින් මූල්‍ය වාර්තාවේ බැඳීම් ලෙස සටහන් කර නොමැත. | වර්ෂයට අදාළ වන මුළු බැරකම් හඳුනාගෙන ගිණුම්ගත කළ යුතු වේ. |

## 2.3. නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

| | නීති,රීති හා රෙගුලාසි වලට යොමුව | නිරීක්ෂණය වටිනාකම රු. | අනුකූල නොවීම | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|---|
| (අ) | 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 40 (1) වගන්තිය | - | මෙම වගන්තිය ප්‍රකාරව අභ්‍යන්තර විගණන ඒකකයක් ස්ථාපිත කර පවත්වාගෙන යා යුතු වුවත්, අභ්‍යන්තර විගණක තනතුර පුරප්පාඩු වී පැවතීම සහ එම අංශයේ සේවකයින් නොමැති වීම නිසා 2021 වර්ෂය තුළ අභ්‍යන්තර විගණන අංශය අක්‍රිය වී පැවතුණි. | අංශයක් පවතින නමුත් නිලධාරීන් පුරප්පාඩු වී ඇත. | මෙම පනතේ සඳහන් වගන්ති ප්‍රකාරව ක්‍රියා කිරීම සුදුසු වේ. |
| (ආ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | | | | |
| | (i) මුදල් රෙගුලාසි 138 සහ 245 (1) | - | වියදම සහතික කිරීමකින් තොරව වවුචර් සඳහා ගෙවීම් නොකළ යුතු වුවත්, 2021 වර්ෂයේදී ගෙවීම් වවුචර් 41 ක් භාවිතා කර එකතුව රු.4,052,364 ක් වියදම සහතික කිරීමකින් තොරව ගෙවීම් කර තිබුණි. | ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරමි. | මෙම මුදල් රෙගුලාසිය අනුව ක්‍රියා කළ යුතුය. |
| | (ii) මුදල් රෙගුලාසි 139 සහ 267 (2) | - | මෙම මුදල් රෙගුලාසි ප්‍රකාරව ගෙවීම් කිරීමට ප්‍රථම සම්පූර්ණ කළ යුතු කරුණු නොසලකා අඩුපාඩු සහිත වවුචර් පත්‍ර 29 ක් භාවිතා කර එකතුව රු.3,261,430 ක් ගෙවීම් කර තිබුණි. | විගණන නිරීක්ෂණය හා එකඟ වෙමි. | මෙම මුදල් රෙගුලාසිය අනුව ක්‍රියා කළ යුතුය. |

| | | | | | |
|---|---|---|---|---|---|
| | (iii) මුදල් රෙගුලාසි 396 (ආ) | - | 2018 ජූලි 10 දින සිට 2021 ඔක්තෝබර් 18 දින දක්වා වූ කාලපරිච්ඡේදය තුළ නිකුත් කරන ලද, නිකුත් කළ නමුත් ගෙවීමට ඉදිරිපත් නොවූ එකතු වටිනාකම රු. 66,571 ක් වූ චෙක්පත් 12 කට අදාළව මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර නිරවුල් නොකර 2022 පෙබරවාරි 28 දිනටත් බැංකු සැසඳුම් සකස් කර තිබුණි. | මෙම අඩුපාඩු ඉදිරියේදී ඇති නොවීමට කටයුතු කරමි. | මෙම මුදල් රෙගුලාසිය අනුව ක්‍රියා කළ යුතුය. |
| (ඇ) | 2016 දෙසැම්බර් 29 දිනැති අංක 30/2016 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය | - | මෙම චක්‍රලේඛය ප්‍රකාරව දෙපාර්තමේන්තුව සතු වාහනවල ඉන්ධන දහනය, 2020 සහ 2021 වර්ෂ වලදී පරීක්ෂා කර නොතිබුණි. | 2022 වර්ෂයේදී සියළුම වාහන වල ඉන්ධන දහනය පරීක්ෂා කිරීමට කටයුතු කර ඇත. | මෙම චක්‍රලේඛය ප්‍රකාරව ක්‍රියා කළ යුතුය. |
| (ඈ) | 2020 අගෝස්තු 28 දින අංක 02/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය සහ මාර්ගෝපදේශ අංක 14 | | | | |
| | (i) 10.2 ඡේදය | - | දෙපාර්තමේන්තුව විසින් 2021 වර්ෂය සඳහා වාර්ෂික කාර්යසාධන වාර්තාවේ කෙටුම්පතක් පරීක්ෂාවන් කිරීමට විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි. | අදාළ වාර්තාව කඩිනමින් විගණනය වෙත ඉදිරිපත් කරනු ලැබේ. | මෙම චක්‍රලේඛය ප්‍රකාරව ක්‍රියා කළ යුතුය. |
| | (ii) 12.2 ඡේදය | - | මෙම වගන්තිය ප්‍රකාරව විගණන හා කළමනාකරණ කමිටු 04 ක් පැවැත්විය යුතු වුවත්, 2021 වර්ෂය තුළ එක් කමිටු රැස්වීමක් පමණක් පවත්වා තිබුණි. | විගණන නිරීක්ෂණය හා එකඟ වෙමි. | මෙම චක්‍රලේඛය ප්‍රකාරව ක්‍රියා කළ යුතුය. |

**2.4 අත්තිකාරම් නිකුත් කිරීම හා පියවීම**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2021 දෙසැම්බර් 31 දිනට සේවය අතහැර ගොස් ඇති නිලධාරීන්ගෙන් අයවිය යුතු මුළු ණය මුදල රු.305,930 වන අතර, එම වටිනාකම තුළ වසර 05 ඉක්මවූ හිඟ ණය එකතු වටිනාකම රු.264,875 ක් විය. එම හිඟ මුදල් අයකර ගැනීමට හෝ නිරවුල් කිරීමට පියවරගෙන නොතිබුණි. | මෙම පැරණි ණය ශේෂ අයකර ගැනීමට කටයුතු කරමින් පවතී. | මෙම හිඟ ණය ශේෂ අයකර ගැනීමට ක්‍රියා කළ යුතුය. |
| (ආ) | 2021 දෙසැම්බර් 31 දිනට විශ්‍රාම ගිය නිලධාරීන්ගෙන් අයවිය යුතු මුළු හිඟ ණය මුදල රු.377,836 ක් වන අතර, මේ අතුරින් වර්ෂ 01 ඉක්මවූ හිඟ ණය එකතු වටිනාකම රු.207,429 ක් විය. එම ණය අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | මෙම මුදල ඉදිරියේදී නිරවුල් කිරීමට කටයුතු යොදා ඇත. | මෙම හිඟ ණය ශේෂ අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |

**3. මෙහෙයුම් සමාලෝචනය**

**3.1. කාර්ය සාධනය**

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ලේඛනාරක්ෂක කටයුතු වලට සම්බන්ධ වෘත්තීය නිලධාරීන් 61 දෙනකු පුරප්පාඩුව පවතින අතර, එසේ ආයතනය තුළ සිටින වෘත්තීය නිලධාරීන්ගේ දැඩි හිඟය ලේඛන කළමනාකරණයට මෙන්ම අධි ලේඛන කළමනාකරණයට හා එම කාර්යයන් වල ප්‍රමාදයට හේතුවී තිබුණි. | බඳවා ගැනීම් තාවකාලිකව නවතා ඇති බැවින් පුරප්පාඩු සම්පූර්ණ කළ නොහැක. මේ සඳහා අවශ්‍ය මූලික කටයුතු සිදුකරමින් පවතී. | මෙම සේවක හිඟයට විසඳුම් ලබාදීමටත් කාලීනව සිටින සේවක මණ්ඩලය මඟින් කාර්යයන් ඉටු කර ගැනීමටත් ක්‍රියා කළ යුතු වේ. |

## 3.2. ප්‍රසම්පාදනයන්

-------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| (අ) 2021 වර්ෂයේ ප්‍රසම්පාදන සැලැස්ම අනුව වර්ෂය තුළ ඉටු කිරීමට සැලසුම් කර තිබූ, එකතු වටිනාකම රු.4,052,364 ක් වූ ප්‍රසම්පාදන කාර්යයන් 09 ක් ඉටු කිරීමට කටයුතු කර නොතිබුණි. | 2021 වර්ෂයේ ප්‍රතිපාදන ඉතිරිවීම් පදනම් කරගෙන මිලදී ගැනීමට කටයුතු සැලසුම් කර තිබූ නමුත්, එම වසර තුළ මිලදී ගැනීමට නොහැකි වූ අතර, 2022 දී මිලදී ගැනීමට කටයුතු කරමින් පවතී. | වර්ෂය තුළ සැලසුම් කළ කාර්යය භාරය ඉටු කර ගැනීමටත් සැලසුම් කාලීනව සංශෝධනය කිරීමටත් ක්‍රියා කළ යුතු වේ. |
| (ආ) දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාල ගොඩනැගිල්ල ප්‍රතිසංස්කරණය කිරීමේ කොන්ත්‍රාත්තුව ඇස්තමේන්තුගත මුළු පිරිවැය රු.මිලියන 992 ක වටිනාකමකට ඉදිකිරීම් කාර්යය සී/ස මධ්‍යම ඉංජිනේරු සේවා (පෞද්ගලික) සමාගම වෙතද, උපදේශකත්ව කාර්යය ඉංජිනේරුමය කාර්යයන් පිළිබඳ මධ්‍යම උපදේශක කාර්යාංශය වෙතද පවරා තිබුණි. එහි ගිවිසුම්ගත කොන්ත්‍රාත් කාලසීමාව 2019 ජනවාරි 07 දින සිට 2020 ජූලි 07 දක්වා විය. එම කාලසීමාව නැවත 2021 මැයි 18 දින දක්වා දීර්ඝ කර තිබුණි. නැවතත් එම කාලසීමාව 2024 ජූලි 30 දින දක්වා දීර්ඝ කිරීමට අමාත්‍ය මණ්ඩල සංදේශ කෙටුම්පතක් අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කර තිබූ නමුත්, ඒ සඳහා අනුමැතිය 2022 අප්‍රේල් මස දක්වා ලැබී නොතිබූ අතර, ගොඩනැගිල්ල සහ අනෙකුත් ප්‍රතිසංස්කරණ කාර්යයන්ද 2022 මැයි මස වනවිටත් අවසන් කර නොතිබුණි. | අප යොමු කළ අමාත්‍ය මණ්ඩල සංදේශයේ කෙටුම්පත සඳහා ලැබී ඇති අමාත්‍ය මණ්ඩල තීරණය අනුව අයවැය දෙපාර්තමේන්තුවෙන් මේ පිළිබඳ සාකච්ඡාවක් ලබාදෙන ලෙස ඉල්ලීමක් යොමු කර ඇත. ලංසු කැඳවීම සඳහා අදාළ අනුමැතිය ලැබී ඇත. | කාර්යය නිම කර නොමැති නිසා කොන්ත්‍රාත් කාලය දීර්ඝ කිරීම අනුමත කරගත යුතු අතර, අනුමත මුළු පිරිවැය ඉක්මවා කාර්යය නිම කිරීමේදී මුදල් වැය කිරීමට සිදුවන නිසා ඒ පිළිබඳ අවධානය යොමු කර කාර්යය නිම කළ යුතුය. |

| | | |
|---|---|---|
| (ඇ) උක්ත ඉදිකිරීමේදී හඳුනාගත් අමතර කාර්යයන් නිම කිරීම සඳහා එකතුව රු.380,382,598 ක ඇස්තමේන්තුගත මුදලකට ඇස්තමේන්තු සකස් කලද, ඒ සඳහා වන මූල්‍ය ප්‍රතිපාදන 2022 වර්ෂය තුළදී ලැබී නොතිබුණි. ඒ අනුව එහි ප්‍රමුඛ කාර්යයන් හඳුනාගෙන එම ප්‍රමුඛ කාර්යයන් ඉටු කිරීමට අනුමැතිය ලැබී තිබුණි. නමුත්, ප්‍රමුඛ කාර්යයන් හඳුනාගෙන ඉටුකිරීමට අමාත්‍ය මණ්ඩල තීරණය ලැබී මාස 05 ක කාලයක් ගතවී තිබුණද, විගණිත 2021 අප්‍රේල් මස දක්වා එම ප්‍රමුඛ කාර්යයන් හඳුනාගෙන නොතිබීම නිසා, මෙම ගොඩනැගිල්ල ප්‍රතිසංස්කරණ කටයුතු අවසන් කිරීම බෙහෙවින් ප්‍රමාද වී තිබුණි. | අයවැය චක්‍රලේඛ 03/2022 අනුව ප්‍රමුඛ කාර්යයන් හඳුනා ගැනීමට ඉදිරියේදී කටයුතු කරනු ලැබේ. | අමාත්‍ය මණ්ඩලයේ තීරණය ප්‍රකාරව ප්‍රමුඛ කාර්යයන් හඳුනාගෙන ඒ අනුව ක්‍රියා කළ යුතුය. |

**3.3 වත්කම් කළමනාකරණය**

**-----------------------------**

**පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.**

| **විගණන නිරීක්ෂණය** | **ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|
| (අ) දෙපාර්තමේන්තුවට අයත් ලේඛන කාණ්ඩ 700 කින් පමණ සමන්විත ජාතික වටිනාකමක් සහිත පොත්පත්, ලේඛන, පෞරාණික ගිවිසුම්, පුස්කොළ පොත් හා රහස්‍ය ලේඛන ආදී ප්‍රවේණිගත වත්කම් විශාල ප්‍රමාණයක් පවතී. මෙම මිල කළ නොහැකි වත්කම් පිළිබඳව මූල්‍ය ප්‍රකාශන මඟින් හෙළිදරව් කර නොතිබූ අතර, එම වත්කම් සමීක්ෂණයක් සිදුකර සමීක්ෂණ වාර්තා විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. | මෙම වත්කම් සමීක්ෂණයක් සිදු කර වාර්තා ඉදිරිපත් කිරීමට කටයුතු කරනු ලැබේ. | මෙම වත්කම් පිළිබඳ සමීක්ෂණයක් සිදුකර සමීක්ෂණ වාර්තා විගණනය වෙත ඉදිරිපත් කළ යුතුය. |

| | | |
|---|---|---|
| (ආ) දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාලය සහ මහනුවර ප්‍රාදේශීය කාර්යාලය පිහිටි ඉඩම් පවරා ගැනීමට කටයුතු කර නොතිබූ අතර, එම ඉඩම් සහ එහි පිහිටි ගොඩනැගිලි ඇතුළු වත්කම් පූර්ව වර්ෂයේදී මෙන්ම 2021 වර්ෂයේදී ද මූල්‍ය ප්‍රකාශනවල දේපළ පිරියත හා උපකරණ යටතේ තක්සේරු කර ගිණුම්ගත කර නොතිබුණි. | නාගරික සංවර්ධන අධිකාරියේ නිර්දේශ ලැබීමෙන් පසුව ප්‍රධාන කාර්යාලය පිහිටි ඉඩම පවරාගත හැකි අතර, මහනුවර ප්‍රාදේශීය කාර්යාලය පිහිටි ඉඩම පවරා ගැනීමේ කටයුතු සිදු කරමින් පවතී. | මෙම ඉඩම් පවරාගෙන තක්සේරු කර ගිණුම්ගත කළ යුතුය. |

## 3.4 කළමනාකරණ දූර්වලතා

----------------------------

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2015 වර්ෂයේදී ඉදිකරන ලද දෙපාර්තමේන්තුවේ රියදුරු විවේකාගාරය සහ වඩු කාමරය ඇතුළත් දෙමහල් ගොඩනැගිල්ලට විවිධ හානි සිදුවී තිබූ අතර, ඒ පිළිබඳව සොයා බලා එම ගොඩනැගිල්ලේ අඩුපාඩු සම්පූර්ණ කිරීමට හෝ එම ගොඩනැගිල්ලට අදාළව සිදුකළ ස්ථානීය පරීක්ෂණ වාර්තාවන් ලබාගෙන එම වාර්තාවන් අනුව පවතින ගැටළු නිරාකරණය කිරීමට කළමනාකරණය පියවරගෙන නොතිබුණි. | මෙම ගොඩනැගිල්ල පිළබඳව ගොඩනැගිලි දෙපාර්තමේන්තුවේ ඉංජිනේරුවරයෙකු 2022 පෙබරවාරි 10 දින ස්ථානීය පරීක්ෂණයක් සිදු කළද, ඊට අදාළ වාර්තාව අප වෙත ලැබී නොමැත. එම වාර්තාව ලැබුණු පසුව එහි නිර්දේශය අනුව කටයුතු කරමි. | මෙම ස්ථානීය පරීක්ෂණය සිදු කර ඉතා දිගුකාලයක් ගතවී ඇත. එම වාර්තාව ලබාගෙන ඒ අනුව ක්‍රියාමාර්ග ගත යුතුව පවතී. |

## 4. මානව සම්පත් කළමනාකරණය

---------------------------------

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2021 දෙසැම්බර් 31 දිනට අනුමත කාර්යය මණ්ඩලය 287 ක් වූ අතර, තත්‍ය කාර්යය මණ්ඩලය 136 ක් වීම මත එදිනට පුරප්පාඩු සංඛ්‍යාව 151 ක් විය. ඒ අනුව දෙපාර්තමේන්තුවේ ජ්‍යෙෂ්ඨ මට්ටමේ තනතුරු වලින් සියයට 56 ක්ද, තෘතියික මට්ටමේ තනතුරු වලින් සියයට 80 ක්ද, ද්විතියික මට්ටමේ තනතුරු වලින් සියයට 67 ක්ද පුරප්පාඩු වී පැවතීම ආයතනයේ දෛනික රාජකාරී කටයුතු සහ කාර්යසාධනය පහළ යාමට හේතුවී තිබුණි. | 01/2021 දරන ජාතික අයවැය චක්‍රලේඛය අනුව බඳවා ගැනීම් නතර කර ඇති බැවින් පුරප්පාඩු සම්පූර්ණ කළ නොහැකිව පවතී. | සමස්ථ කාර්යය මණ්ඩලයෙන් සියයට 53 ක් පමණ පුරප්පාඩු වී ඇත. ඉතා දිගුකාලයක සිට මෙම ගැටළුව නිරාකරණයට පියවර නොගැනීම නිසා ආයතනයේ එදිනෙදා මහජන සේවාවන් ඉටු කිරීමටද බාධා වී ඇත. මෙම ගැටළු නිරාකරණය සඳහා පියවරගත යුතුව පවතී. |